# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/46 - 2022 නොවැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 (1) වගන්තිය යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයන්හි බලපැවැත්වෙන පරිදි සංවර්ධන අයදුම්පත් පෙරසැරි කිරීමට අදාළ කඩිනම් සේවා ඒකකය ස්ථාපනය කිරීම දැන්වීම**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3(1) වගන්තිය යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙසට ප්‍රකාශයට පත්කරනු ලැබූ සියළු ප්‍රදේශ සඳහා සංවර්ධන අනුමැතීන් ලබාදීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම උදෙසා එකී නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 5(1) වගන්තිය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් කඩිනම් සේවා ඒකකය පිහිටුවනු ලැබීමට, එකී පනතේ, 21(1) වගන්තියෙන්, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව, අනුමැතිය ලබාදුන් බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

1. කඩිනම් සේවා ඒකකය පිහිටුවීම :
   නාගරික සංවර්ධන අධිකාරි පනතේ 5(1) වගන්තිය ප්‍රකාරව කඩිනම් සේවා ඒකකය පිහිටුවනු ලබන අතර, එම ඒකකය විෂයපථ කමිටුව සහ සැලසුම් කමිටුව යන කමිටු දෙකකින් සමන්විත වනු ලැබේ.

2. කඩිනම් සේවා ඒකකයේ බලතල සහ කාර්යයන්.

පහත කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ බලතල කඩිනම් සේවා ඒකකය සතුව පවතී;

i. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයන් තුළ සිදුකරන ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා අයදුම්පත් භාරගැනීම, සැකසීම, ඇගයීම, පෙරසැරි ගාස්තු ලබාගැනීම සහ සංවර්ධන අනුමැතීන් ලබාදීම.

ii. අයදුම්කරු හෝ සංවර්ධකයා වෙනුවෙන් අනෙකුත් පාර්ශව ආයතන වෙතින් අදාළ අනුමැතීන් සහ නිශ්කාෂන සඳහා ඉල්ලුම් කිරීම.

iii. අදාළ පාර්ශව ආයතනයන්හි නියෝජිතයින් හා නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමග කඩිනම් සේවා ඒකකයෙහි විෂයපථ කමිටුව පිහිටුවීම සහ විෂයපථ කමිටු රැස්වීම් පැවැත්වීම.




මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

iv. නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගෙන් සමන්විත වන්නාවූ කඩිනම් සේවා ඒකකයෙහි සැලසුම් කමිටුව පිහිටුවීම සහ සැලසුම් කමිටු රැස්වීම් පැවැත්වීම.

v. කඩිනම් සේවා ඒකකයෙහි විෂයපථ කමිටුව හා සැලසුම් කමිටුව නියෝජනය කළ යුතු අදාළ පාර්ශව ආයතනයන් තීරණය කිරීම.

vi. ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සංවර්ධන අනුමැතින් සඳහා අවශ්‍ය වන්නා වූ අයදුම්පත් පෙරසැරි කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා කඩිනම් සේවා ඒකකයට අනන්‍ය වූ අයදුම් කිරීමේ පටිපාටි, අයදුම්පත පෙරසැරි කිරීමේ ක්‍රියාවලිය සහ පෙරසැරි ගාස්තුන් සැකසීම හා යාවත්කාලීන කිරීම.

vii. කවර හෝ ආයතනයකට තම අයදුම්පත් පෙරසැරි කිරීමට අදාළ නීතියෙන් දක්වා ඇති අවම කාලය විෂයපථ කමිටුව වෙත දැනුම් දීමෙන් පසු එකී කාල සීමාව තුළ අයදුම්පත් පෙරසැරි කිරීමට සහ අනුමැතීන්, නිශ්කාෂන හෝ නිර්දේශ නිකුත් කිරීමට අවසර ලබාදීම.

viii. තම අයදුම්පත් පෙරසැරි කිරීම සඳහා මෙම *ගැසට් පත්‍රයේ* 2(VII) වගන්තියෙහි දක්වා ඇති පරිදි අදාළ නීතින් නොමැති අවස්ථාවන්හිදී, සෑම ආයතනයක් විසින්ම තම අයදුම්පත් පෙරසැරි කිරීම, අනුමැතින්, නිශ්කාෂන සහ නිර්දේශයන් වැඩ කරන දින 14 ක් හෝ විෂයපථ කමිටුව විසින් තීරණය කරනු ලබන කාල සීමාවක් ඇතුළතදී ලබාදීමට කටයුතු කළ යුතුය.

ix. මෙම *ගැසට් පත්‍රයේ* මෙයට පෙර 2(VII) සහ 2(VIII) වගන්තින්හි සඳහන් කාල පරාසයන් තුළදී අදාළ ආයතනයන් සංවර්ධන බලපත්‍රය පෙරසැරි කිරීමට අපොහොසත් වන අවස්ථාවකදී, අයදුම්කරු විසින් සංවර්ධන කටයුත්තට අදාළ අනෙකුත් සියළුම අවශ්‍යතාවන් සපුරා ඇත්නම්, විෂයපථ කමිටුව විසින් සාමූහික නිර්දේශයක් ලබාදීම සහ අදාළ සියළු අනුමැතීන් සහ නිශ්කාෂනයන් අදාළ ආයතනයන්ගෙන් ලැබුණු පසුව එකී අයදුම්පත් අවශ්‍ය අනුමැතිය සඳහා සැලසුම් කමිටුවට යොමු කිරීම.

x. කඩිනම් සේවා ඒකකය වෙත ඉදිරිපත් කෙරෙන අයදුම්පත්‍ර සඳහා අවශ්‍ය පාරිසරික උපදේශන කමිටුව (ECC) සහ රථවාහන බලපෑම් ඇගයීමේ කමිටුව (TIA) පැවැත්වීම සහ අවසන් තීරණ ගැනීම සඳහා 2(IV) වගන්තිය මගින් පිහිටුවන ලද සැලසුම් කමිටුව වෙත බලතල අභිනියෝජනය කිරීම.

xi. අයදුම්කරු විසින් ව්‍යාජ තොරතුරු හෝ ලිපිලේඛන ඉදිරිපත් කරන ඕනෑම අවස්ථාවක එම සංවර්ධන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම.

3. විෂයපථ කමිටුව නියෝජනය කරන පාර්ශව ආයතනයන්

විෂයපථ කමිටුව පහත ආයතනයන්ගෙන් සමන්විත විය යුතුය;

3.1 නාගරික සංවර්ධන අධිකාරිය

3.2 අනෙකුත් පාර්ශව ආයතන

i. මධ්‍යම පරිසර අධිකාරිය
ii. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
iii. ලංකා විදුලිබල මණ්ඩලය
iv. සීමාසහිත ලංකා විදුලිබල (පෞද්.) සමාගම
v. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
vi. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
vii. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
viii. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ix. මාර්ග සංවර්ධන අධිකාරිය
x. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
xi. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව
xii. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

xiii. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
xiv. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
xv. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
xvi. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xvii. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
xviii. තේ, රබර් සහ පොල්වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය
xix. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
xx. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
xxi. ආරක්ෂක අමාත්‍යාංශය
xxii. අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය - බස්නාහිර පළාත
xxiii. ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය
xxiv. කම්කරු දෙපාර්තමේන්තුව
xxv. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
xxvi. පොලිස් මූලස්ථාන රථවාහන අංශය

3.3. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත ප්‍රදේශයන්හි සියළුම පළාත් පාලන ආයතනවල පහත දැක්වෙන විෂයපථයන් සම්බන්ධ නියෝජිතයන්

i. නගර සැලසුම් අංශය
ii. ජලාපවහන හා ජලසම්පාදන අංශය
iii. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය
iv. තක්සේරු දෙපාර්තමේන්තුව
v. ගිනි නිවීමේ සේවා දෙපාර්තමේන්තුව
vi. රථවාහන සැලසුම් සහ මාර්ග ආරක්ෂාව සම්බන්ධ අංශය

4.1 කඩිනම් සේවා ඒකකයෙහි විෂයපථ කමිටුව පහත අයුරින් සමන්විත විය යුතුය.; 4."විෂයපථ කමිටුවේ හා සැලසුම් කමිටුවේ" සංයුතිය

i. කමිටු සාමාජික

*අ.* ***කමිටු සභාපති :*** නාගරික සංවර්ධන අධිකාරියෙහි සභාපති හෝ සභාපති විසින් විශේෂිතව දක්වා සිටින ලද කාර්යයන් සිදු කරගෙන යාම සඳහා ඔහු විසින් නම් කරනු ලැබූ අධ්‍යක්ෂ ජනරාල් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) තනතුරෙහිලා සිටින නිළධාරියෙක්.

*ආ.* නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්

*ඇ.* නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)

*ඈ.* කැඳවුම්කරු : නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) හෝ සහකාර අධ්‍යක්ෂ(සැලසුම්)

*ඉ.* මෙම *ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියෙහි සඳහන් කර ඇති ආයතනයන්ගෙන්, විෂය පථ කමිටු සභාපති විසින් නම් කරන ලද එක් එක් ආයතනයන් නියෝජනය කිරීම සඳහා එක් ආයතනයකින් නම් කරන ලද එක් නිලධාරියෙකු සහ ගොනුව සම්බන්ධ කටයුතු සිදුකරනු ලබන නිලධාරියා

*ඊ.* එක් එක් අවස්ථාවන්ට අනුව, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (සැලසුම්) සහ අධ්‍යක්ෂ (සැලසුම්) විසින් නම් කරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) / සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරහි නිලධාරියකු

*උ.* නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (නීති), හෝ අධ්‍යක්ෂ (නීති) විසින් නම් කරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) / සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරහි නිලධාරියකු

*ඌ.* මධ්‍යම කළමනාකරණ ගණයේ නගර නිර්මාණ ශිල්පී තනතුරේ හෝ බලාත්මක සැලසුම් නිලධාරී තනතුරේ හෝ ඊට සමාන තනතුරක රාජකාරී සිදුකරන නිලධාරීන්

ii. ආරාධිත සාමාජිකයින්

අ. එක් එක් අවස්ථාවන්ට අනුව, විෂයපථ කමිටු සභාපති විසින් නම් කරනු ලබන නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් අංශයන්හි නිළධාරීන්.

iii. කමිටු සාමාජික නොවන ආරාධිතයන්

අ. අයදුම්කරු / සංවර්ධනකරු (අවශ්‍ය නම්)
ආ. සුදුසුකම්ලත් තැනැත්තන් (අවශ්‍ය නම්)

4.2 කඩිනම් සේවා ඒකකයෙහි සැලසුම් කමිටුව පහත අයුරින් සමන්විත විය යුතුය.;

අ. **කමිටු සභාපති** : නාගරික සංවර්ධන අධිකාරියෙහි සභාපති හෝ සභාපති විසින් විශේෂිතව දක්වා සිටින ලද කාර්යයන් සිදු කරගෙන යාම සඳහා ඔහු විසින් නම් කරනු ලැබූ අධ්‍යක්ෂ ජනරාල් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) තනතුරෙහි ලා සිටින නිළධාරියෙක්

ආ. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්

ඇ. නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)

ඈ. **කැඳවුම්කරු** : නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) හෝ සහකාර අධ්‍යක්ෂ(සැලසුම්)

ඉ. එක් එක් අවස්ථාවට අනුව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (සැලසුම්) සහ අදාළ අධ්‍යක්ෂ (සැලසුම්) විසින් නම් කරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්) / සහකාර අධ්‍යක්ෂ(සැලසුම්) තනතුරහි නිලධාරියකු

ඊ. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (නීති), හෝ අධ්‍යක්ෂ (නීති) විසින් නම් කරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) / සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරහි නිලධාරියකු

උ. මධ්‍යම කළමනාකරණ ගණයේ නගර නිර්මාණ ශිල්පී තනතුරේ හෝ බලාත්මක සැලසුම් නිලධාරී තනතුරේ හෝ ඊට සමාන තනතුරක රාජකාරී සිදුකරන නිලධාරීන්

**5. අදාළ පාර්ශව ආයතන තුළින් විෂයපථ කමිටුව සඳහා සාමාජිකයින් නම් කිරීම සහ ඉල්ලා අස්වීම**

5.1 මෙහි මින් පෙර 3 වන වගන්තියෙහි දක්වා ඇති පාර්ශව ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද තම ආයතනය නියෝජනය කරන තීරණ ගතහැකි එක් සාමාජිකයෙකු ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

5.2 පාර්ශව ආයතනයන්හි ප්‍රධානියා විසින් පත් කරනු ලැබූ නාමිකයන් තම ඉල්ලා අස්වීමේ දිනයට සති දෙකකට පෙර විෂයපථ කමිටුවේ සාමාජිකත්වයෙන් එසේ ඉල්ලා අස්වීමේ අදහස විෂයපථ කමිටුවේ සභාපති වෙත ලිඛිතව දැනුම් දිය යුතු වන අතර, ඉල්ලා අස්වීමේ ලිපිය සමග එකී ඉල්ලා අස්වීම වෙනුවට යෝජනා කරන්නා වූ නව සාමාජිකයන්ගේ නාම යෝජනා ඒ හා සමානව භාර දියයුතුය.

**6. සංවර්ධන අයදුම්පත් සඳහා අදාළ වන්නා වූ ගාස්තු**

6.1 සංවර්ධන අයදුම්පත් සඳහා අදාළ වන්නා වූ පෙරසැරි ගාස්තු පහත පරිදි වේ.

| *සංවර්ධන අයදුම්පත් වර්ගය* | *මූලික ගාස්තුව* | *පෙරසැරි ගාස්තුව* |
|---|---|---|
| මූලික සැලසුම් නිරාකරණය | රු. 10,000.00 | අංක 2235/54 දරන 2021 ජූලි මස 8 වන දින නිකුත් කරන ලද *ගැසට්* නිවේදනයට අනුව නා.සං.අ. විසින් අනුමැතීන් ලබාගැනීමේ සාමාන්‍ය ක්‍රියාවලිය සඳහා අය කරනු ලබන පෙරසැරි ගාස්තුව මෙන් 3.5 ගුණයක්. + රජයේ අනුමත බදු මුදල් |
| ඉඩම් අනුබෙදුම් අයදුම්පත | රු. 10,000.00 | |
| ගොඩනැගිලි අයදුම්පත | රු. 20,000.00 | |
| සංශෝධනය කිරීම් | රු. 20,000.00 | |
| අනුකූලතා සහතිකය | රු. 10,000.00 | |
| නැවත අළුත් කිරීමේ අයදුම්පත | රු. 10,000.00 | |

6.2. මූලික ගාස්තුව අයදුම්පත භාරගැනීමේදී අය කරනු ලබන අතර එම මූලික ගාස්තුව මුළු පෙරසැරි ගාස්තුවෙන් අඩු කරනු ලැබේ.

6.3 අයදුම්පත් පෙරසැරි කිරීමේදී රු. 1000/- ක් ස්ථිර ප්‍රවාහන ගාස්තු ලෙස අයකරනු ලබන අතර එයට අමතර සෑම කිලෝමීටරයකටම රු.100/- බැගින් අයකරනු ලැබේ. (එක් කිලෝමීටරයකට අයකරන මුදල කලින් කලට වෙනස් කිරීමට යටත්වනු ඇත.)

ප්‍රසන්න රණතුංග (පා.ම).
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 නොවැම්බර් මස 15 වැනි දින,
නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහළ" සුහුරුපාය"
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.